## 1·1 හැඳින්වීම

මානවයාගේ වර්ධනයත් සමඟ සමාජය ශිෂ්ට සම්පන්න වෙමින් විකාශයට පත්වීමේ දී ඔවුන්ගේ විවිධ අවශ්‍යතාවයන් හේතුකොටගෙන ගීතය නම් වූ සියුම් කලාවද විවිධ යුග පසුකරමින් විකාශය විය. සියලු සත්වයන්ට වඩා මිනිසා නිර්මාණශීලී ක්‍රියාවන් හා හැකියාවන් වර්ධනය කර ගනිමින් නිමක් නැති ගවේෂණයක නියැලී සිටී. එකී ගවේෂණයන්ගේ මූලිකවූ කලා මාධ්‍යය ගීතයයි.

නූතන සිංහල ගීතය ආරම්භ වන්නේ 19 වන සියවසේ අගභාගයේදී නාඩගම් හා නූර්තිවලිනි. ඉන්පසු ග්‍රැමෆෝන් ගී, චිත්‍රපට ගී, වේදිකා නාට්‍ය ගී, සරල ගී ආදී වශයෙන් එය ක්‍රමයෙන් විකාශය වන්නට විය. මෙරට සංගීතකලාවේ නිර්මාණ ක්ෂේත්‍රයට පමණක් නොව සමස්ත කලාවටම විවිධාකාර දේශපාලන, ආර්ථික, සංස්කෘතිකමය හා සමාජමය වශයෙන් විවිධ බලපෑම් එල්ල විය. මෙකී බලපෑම් හේතු කොටගෙන ගීතයද විවිධ විපර්යාසයන්ට භාජනය වී ඇතිබව කිව යුතු නොවේ.

රාගධාරී සංගීතයෙන් වියුක්ත වී ස්වාධීන ආකෘතීන් ඔස්සේ නව ගීත සම්ප්‍රදයක් 1940 දශකයේ ආනන්ද සමරකෝන් මහතාගේ ප්‍රමුඛත්වයෙන් මෙරට ස්ථාපිත විය. අපරදිග සංගීත ලක්ෂණ සහිතව ගොඩනැගෙමින්ආ මෙම නව ගීතයන් ''සරල ගීත'' නමින් ව්‍යවහාර වුණි. බටහිර බලපෑම අනිවාර්ය අංගයක් වූ මෙම යුගයේ ගීතයටද බටහිර අංග ලක්ෂණයන් (chords) එකතු විය.

1960 දශකයෝ සිංහල සරල ගීතයේ වැදගත් ප්‍රවණතාවයක් රැසක්ම සිදුවිය. ගායක, වාදක කණ්ඩායම් බිහිවීම, සංගීත සංදර්ශන ව්‍යාප්ත වීම, ගීත කැසට්පට ව්‍යාප්ත වීම මෙන්ම ගී පද රචකයින් තනු හා සංගීත නිර්මාණ ශිල්පීන්ද බිහිවිය. මෙවැනි සංඝටක ඔස්සේ සරල ගීතය විවිධ විපර්යාසයන්ට භාජනය වෙමින් විකාශය වෙද්දී තාක්ෂණික වශයෙන් මෙන්ම ගුණාත්මක බවින්ද ගීතයේ ඇතිවූ වෙනස සුළුපටු නොවේ.

පදරචනය, තනු රචනය හා සංගීත නිර්මාණය, ගායනය වාදනය, මෙන්ම නාද සංතුලනය මගින්ද සුවිශේෂී වූ දක්ෂතාවයන් පෙන්නුම් කරමින් ආනන්දයෙන් ප්‍රඥාව කරා රැගෙන ගිය

ගීත සම්භාරයක හිමිකාරීත්වය රසික අප වෙත හිමිව තිබුණු බව නොරහසකි. නමුදු වර්තමානයේ බොහෝ දුරට දකින්නට ලැබෙන්නේ අතිශය පෞද්ගලික අවශ්‍යතා මුදුන්පත් කර ගැනීම උදෙසා ''ගීතය'' නම් වූ ජනප්‍රිය කලාමාධ්‍ය මුල්‍යමය මෙවලමක් බවට පත්කරගෙන ඇති ආකාරයකි. එහි කලාත්මක හෝ ගුණාත්මක බවක සේයාක්වත් සොයාගන්නට නැත. කිසිදු අර්ථයක් නැති ගොරහැඩි රළු වචනමාලාවක් හෝ වචනවලට නොගැලපෙන තනුවක් සංගීතයක්, අර්ථ රසයක් හෝ ශබ්ද රසයක් නොමැති කුමන හෝ නිර්මාණයක් ගීතයක් යැයි හඳුන්වමින් පොදු රසිකයා වෙත සමීප කරවීම වර්තමානයේ බහුලව සිදුවන දෙයකි. එපමණක් නොව, ගීතයක මූලික නිර්මාණාත්මක ක්‍රමවේදය වන සංගීතයද ඝෝෂාකාරී නාදයන් යොදමින් වල්මත් කර ඇත. 1977 විවෘත ආර්ථික ප්‍රතිපත්තියත් සමග ගීතය සමාජගත වූයේ ප්‍රමිතියෙන් තොර අවරගණයේ නිර්මාණ කාර්යයක් ලෙසිනි. අතරින් පතර හොඳ ගීතයකට දැහැන්ගත වන්නට හැකිවුවත් , එයද එක්තරා කාලසීමාවකට පමණි. එදා හදවතට ආනන්දය මෙන්ම ප්‍රඥාව ලබාදුන් ගීතය අද තිරික්කල ගායනාවක් බවට පත් ව ඇත. මෙය කිසියම් වූ පරිණාමයක් වුවත් එය විපරීත පරිණාමයකි. තාක්‍ෂණය නොදියුණු තත්වයක පැවති 50-60-70 දශකවල ගීත අප අදටත් වින්දනය කරන්නේ ඒ තුළ තිබූ ගුණාත්මක හා කලාත්මක ප්‍රමිතිය නිසාවෙනි. අද තාක්‍ෂණය කෙතරම් දියුණු මට්ටමක පැවතියත් ගීතයට, එහි ප්‍රමිතියට කිසිදු ඇගයීමක් ලබා දිය නොහැකිය. මන්ද, ඒ තරමට ''ගීතය'' වල්මත්වී ඇති හෙයිනි.

මෙම තත්වය ගීතයට පමණක් අත්වූ ඉරණමක් නොව සමස්ත නිර්මාණ ලෝකයටම පොදුවේ බලපා ඇති ඉරණමකි. කෙසේ වුවද, ශ්‍රාවක සවන්පත් සනසා ඔවුන්ගේ හෘද සංතෘෂ්ටිය මත බුද්ධිමය සංවාදයක නියැළෙන්ට අවශ්‍ය නිර්මාණාත්මක මෙන්ම තාක්‍ෂණික ක්‍රමවේදයන්ගේ ප්‍රතිඵල උපරිම වශයෙන් දයකකරගත් ප්‍රමිතිගත වූ ගීතයක අවශ්‍යතාවය මේ වනවිට දැඩිව දැනේ. සිදුවී ඇති විපර්යාසය දෙස උපේක්ෂාවෙන් හෝ තම්පාවෙන් නොබලා ඒ දෙස යථාභූතඥානයෙන් බැලිය යුතු යුගයක, ගීතයේ අතීතය මෙන්ම වර්තමානයද පර්යේෂණාත්මක ලෙස අධ්‍යයනයට ලක්කරමින් ගොඩනගන ලද මෙම පර්යේෂණ නිබන්ධය, අර්ථ පූර්ණයෙන් හා රසඥතා ගුණයෙන් පිරිපුන් ගීතයක් නිර්මාණය කිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කරන උත්තේජනයකි.

ගීතය පිළිබඳව එහි ආරම්භක අවධියේ පටන් අද්‍යතනය දක්වා සංකීර්ණවූත් ගැඹුරු වූත් අර්ථ නිරූපනයෙන් සිදුවුවත්, විමර්ශනයට හා මතවාදයට භාජනය කළත් , එහි ප්‍රමිතිය පිළිබඳව ක්‍රමවත් වූ විමර්ශනයක් මෙතෙක් සිදුකොට නොමැති බව හැඟේ. ගීතයේ නිර්මාණාත්මක

ක්‍රමවේදයන් මෙන්ම එහි තාක්‍ෂණික භාවිතාවන් පිළිබඳව කොතෙකුත් කෘතීන් රචනා කර තිබුණද, ඒවා ගීතයේ ප්‍රමිතිය ගොඩනගන්නට කොපමණ ඉවහල් වුවාදැයි යන්න පිළිබඳව පර්යේෂණාත්මක ව අධ්‍යයනයක් සිදුවී නොමැත.

ගීතය හුදෙක් ලාමක ආස්වාදයක් ලබාදීමට පමණක් පැවතෙන කලා මාධ්‍යයක් නොවේ. ප්‍රඥාවේ දොරටු විවර කරන යහපත් ගේ ය පද, සංගීතය හා තනු රචනය, ගායනය, වාදනය තාක්‍ෂණික භාවිතාව, රසවින්දනය ආදි සියල්ලම නව චින්තනයක් ගොඩ නගන්නට කරන්නාවූ ආරාධනාවකි. ඒ අනුව මෙකී පර්යේෂණය ගීතයේ සියලු සංඝටක මෙන්ම එහි ආත්මීය ගුණයද මනාලෙස හඳුනාගෙන, ජනප්‍රිය ලේබලයෙන් මිදී ප්‍රමිතිගත වූ සරල ගීතයක් මතු පරපුරට දායාද කරන්නට අවශ්‍ය මාවත විවර කරන්නකි.

## 1.2 ගැටළුව

ශ්‍රී ලාංකේය සරල ගීතයේ ප්‍රමිතියේ වෙනසක් තිබෙනවාද?

### උපන්‍යාසය

ශ්‍රී ලාංකේය සරල ගීතයේ ප්‍රමිතියෙහි වෙනසක් ඇත.

## 1.3 අරමුණු හා අභිමතාර්ථ

- ලාංකේය සරල ගීතය හඳුනාගැනීම
- සරල ගීතයේ විකාශය හඳුනාගැනීම
- ගීතයේ නිර්මාණාත්මක ක්‍රමවේදයන් හඳුනාගැනීම
- නාදය හා ශබ්දය අතර වෙනස හඳුනා ගැනීම
- නාද පටිගත කිරීමේ තාක්‍ෂණික උපකරණ හා ශබ්දාගාර තාක්‍ෂණය හඳුනාගැනීම
- වෙළඳපොළ තර්කය හමුවේ නිර්මාණය වන ජනප්‍රිය ගීතය හඳුනාගැනීම
- රසවින්දනය ගීතයේ ප්‍රමිතිය ගොඩනගන ආකාරය හඳුනාගැනීම
- ගීත නිෂ්පාදන ආයතන හඳුනාගැනීම